OL/2010/63-S-I,II
සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | | |
|---|---|---|
| ව්‍යාවසායකත්ව අධ්‍යයනය | I, II | පැය තුනයි |
| முற்சியாண்மைக் கற்கை | I, II | மூன்று மணித்தியாலம் |
| Entrepreneurship Studies | I, II | Three hours |

## ව්‍යාවසායකත්ව අධ්‍යයනය I

සැලකිය යුතුයි :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. ව්‍යාවසායකත්ව සංකල්පයේ අදහස පිළිබඳව ශිෂ්‍යයින් හතරදෙනෙකු දක්වා ඇති පහත සඳහන් අර්ථකථනවලින් වඩාත් සාර්ථක අර්ථකථනය තෝරන්න.
   (1) දුරදක්නා පැහැදිලි ඉලක්කයක් ඇතිව ව්‍යාපාර කටයුතු කිරීම
   (2) රටට වැඩදායී පුරවැසියෙකු වීමේ නව දක්මක් සහිතව කටයුතු කිරීම
   (3) නිෂ්පාදන සාධක ප්‍රශස්ත මට්ටමින් කළමනාකරණය කිරීම
   (4) නව ක්‍රම නිර්මාණය කරමින් නව භාණ්ඩ හා සේවා නිපදවීමට කටයුතු කිරීම

2. ව්‍යාවසායකත්වයෙන් ප්‍රදේශයට අත්වන ප්‍රතිලාභයක් ලෙස යටිතල පහසුකම් වැඩිදියුණු වීම දැක්විය හැකි ය. මෙහි 'යටිතල පහසුකම් වැඩිදියුණු වීම' යන්නෙන් අදහස් වන්නේ
   (1) ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු වීම ය.
   (2) සෞඛ්‍ය හා ආරක්ෂාව වැනි සුභසාධක පහසුකම් වැඩිදියුණු වීම ය.
   (3) මහාමාර්ග, විදුලිබලය, ජලය වැනි පහසුකම් වැඩිදියුණු වීම ය.
   (4) රැකීරක්ෂාවල සුරක්ෂිතභාවය තහවුරු වීම ය.

3. පහත දක්වෙන්නේ එක්තරා ආහාර නිෂ්පාදන ආයතනයක් විසින් දක්වා ඇති ප්‍රකාශනයකි.
   "ලෝක සාගිනි නිවාරණය කිරීම" මෙය, මෙම ආයතනයේ
   (1) දක්ම විය හැකි ය. (2) මෙහෙවර විය හැකි ය.
   (3) ඉලක්කය විය හැකි ය. (4) පරමාර්ථය විය හැකි ය.

4. ව්‍යාවසායකත්ව සංවර්ධනයේදී පුද්ගලයින්ට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වේ. එවැනි අභියෝගයක් ලෙස මනෝවිතිතිය (mindset) සඳහන් කෙරේ. මෙහි 'මනෝවිතිතිය' යනුවෙන් අදහස් කෙරෙන්නේ
   (1) නීතිමය වශයෙන් පවතින බාධා ය. (2) ව්‍යාවසායකත්ව භූමිකාවල හිඟකම ය.
   (3) ව්‍යාපාරික පවුල් පසුබිමක් නොමැති වීම ය. (4) පුද්ගලයාගේ මනස යම් රාමුවකට කොටු වීම ය.

5. සමාජයීය ව්‍යාවසායකයින් බිහිවීමට **ප්‍රධානතම** හේතුව ලෙස පිළිගත හැක්කේ
   (1) සමාජයේ ලෙඩ රෝග පැතිරීම ය. (2) යුද්ධ වාතාවරණයක් පැවතීම ය.
   (3) පරාර්ථකාමී වීම ය. (4) පරිසරය දූෂණය වීම ය.

6. අනෙකුත් ආසියාතික රටවලට වඩා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් උගතුන් බව වාර්තා වුවද කාන්තාවන් ව්‍යාවසායකත්ව කටයුතුවලට වැඩි ඇල්මක් නොදක්වන බව සඳහන් වේ. මෙයට **ප්‍රධානතම** හේතුවක් ලෙස පිළිගත හැක්කේ
   (1) කාන්තාවන් අවදානම් දැරීමට මැළි වීම ය.
   (2) කාන්තාවන්ගේ තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවීම ය.
   (3) කාන්තාවන්ගේ සමාජ සම්බන්ධතා අවම මට්ටමක පැවතීම ය.
   (4) කාන්තාවන් ව්‍යාපාර තීරණ ගැනීමට පසුබට වීම ය.

[ දෙවැනි පිටුව බලන්න.

7. ව්‍යාපාර ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම හා විශාල වශයෙන් වර්ග කර දක්වේ. මෙම වර්ගීකරණයට පදනම වන්නේ
(1) අයිතියයි. (2) පරමාර්ථයයි. (3) සංවිධාන ක්‍රමයයි. (4) පරිමාණයයි.

8. කුඩා ව්‍යාපාරවල දකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ
(1) රැකියා අවස්ථා සුළු ප්‍රමාණයක් ජනිත කිරීම ය.
(2) වෙළඳපොළට ප්‍රබල බලපෑමක් කළ නොහැකි වීම ය.
(3) අයිතිකරුවන්ට වැඩි ලාභයක් නොලැබීම ය.
(4) යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස නොලැබීම ය.

9. වඩා සාර්ථක ව්‍යවසායකයෙකු බිහිවීම සඳහා බලපාන සාධක **පමණක්** ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) බුද්ධිය, ධනය, සම්බන්ධතා (2) අධ්‍යාපනය, පළපුරුද්ද, ධනාත්මක ආකල්ප
(3) ධනය, සම්බන්ධතා, ධනාත්මක ආකල්ප (4) හැකියා, සම්බන්ධතා, බුද්ධිය

10. ව්‍යාපාර කෙරෙහි උනන්දුවන විවිධ පාර්ශ්ව අතුරෙන් ආයෝජකයින් වැදගත් වේ. ආයෝජකයින් ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට බලපාන හේතුවක් ලෙස සැලකිය හැක්කේ
(1) පරිසර සුරක්ෂිතතාව ය.
(2) වැටුප් හා රැකියා වරප්‍රසාද ය.
(3) ගුණාත්මක භාණ්ඩ සාධාරණ මිලට ලබා ගැනීම ය.
(4) ප්‍රමාණවත් ඉපයීමක් ලබා ගැනීම ය.

11. ව්‍යාපාර අවදනම් පැනනැගීමට ප්‍රධාන හේතුවක් වන්නේ
(1) නිර්මාණශීලීත්වය හා නව උත්පාදනයක් නොමැති වීම ය.
(2) පරිසරයේ ගතිකත්වය හා අවිනිශ්චිතතාව ය.
(3) කළමනාකාරිත්වයේ දුර්වලතා ය.
(4) ව්‍යවසායකත්වය හුදෙකලා වීම ය.

12. ව්‍යාපාරයක් හා සබැඳි පසුපස ව්‍යාපාර හා ඉදිරිපස ව්‍යාපාර දකිය හැකි ය. පාවහන් නිෂ්පාදනයක් හා සබැඳි ඉදිරිපස ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) සම් සැපයුම්කරුවන්, මෝස්තරකරුවන්, සිල්ලර වෙළෙඳුන්
(2) බෙදාහැරීමේ නියෝජිතයින්, මෝස්තරකරුවන්, උපකොන්ත්‍රාත්කරුවන්
(3) බෙදාහැරීමේ නියෝජිතයින්, ප්‍රචාරණ නියෝජිතයින්, සිල්ලර වෙළෙඳුන්
(4) ඇසුරුම් ද්‍රව්‍ය සපයන්නන්, මෝස්තරකරුවන්, ප්‍රචාරණ නියෝජිතයින්

13. ව්‍යවසායකයකුගේ කටයුතුවල සාර්ථකත්වයට බෙහෙවින් බලපාන සඵලදායි සන්නිවේදනයක දකිය හැකි ගුණාංගයක් වන්නේ
(1) මෘදුකාංග සුලභතාව ය. (2) පූර්ණ බව ය.
(3) ජාල සම්බන්ධතාව ය. (4) තොරතුරු ය.

14. සුනිමල් තුළ දකිය හැකි ගති ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.
A. විචක්ෂණ බව B. ආත්ම තෘප්තිය C. දැඩි අධිෂ්ඨානය
D. අධ්‍යාපනය E. කැපවීම F. නම්‍යශීලී බව
මේවායින් ඔහු තුළ ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ වන්නේ
(1) A, B, D හා F ය. (2) A, C, E හා F ය. (3) A, C, D හා F ය. (4) B, C, D හා E ය.

15. ව්‍යවසායකයෙකුට විවිධ භූමිකා තුළ කටයුතු කිරීමට සිදු වේ. ඒවායින් නායකත්ව භූමිකාව තුළ ව්‍යවසායකයෙකුට ඉටු කිරීමට සිදු වන කාර්යයක් වන්නේ
(1) සැලසුම් කිරීම ය. (2) සම්පත් සැපයීම ය. (3) අවදානම් දරීම ය. (4) කණ්ඩායම් මෙහෙයවීම ය.

16. ධනදාස මහතා තම පවුලේ සාමාජිකයින්ගේ සහාය ඇතිව ආහාර සකස් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් තම නිවසේ පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය අයත් වන්නේ
(1) ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාරවලට ය. (2) මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ය.
(3) මහා පරිමාණ ව්‍යාපාරවලට ය. (4) කාර්මික ව්‍යාපාරවලට ය.

17. ව්‍යවසායකයින් තුළ ව්‍යාපාර අදහස් ජනනය වීමට පරිසර සාධක බෙහෙවින් බලපායි. මේ අතුරෙන් සමාජයීය හා සංස්කෘතික පරිසර සාධකයක් ලෙස සැලකෙන්නේ
(1) විවේකය හා විනෝදයයි. (2) සෞඛ්‍යය හා ආරක්ෂාවයි.
(3) චාරිත්‍ර වාරිත්‍ර යි. (4) ප්‍රවාහනය හා සන්නිවේදනයයි.

[ තුන්වැනි පිටුව බලන්න.

18518



18. ව්‍යවසායකයින් තුළ පහළ වන ව්‍යාපාර අදහස් සැම විට ම ව්‍යාපාර අවස්ථාවක් බවට පත් කළ නොහැකි ය. පහත සඳහන් ප්‍රකාශයින් ව්‍යාපාර අදහසක යෝග්‍යතාව තක්සේරු කෙරෙන සාධක **පමණක්** ඇති පිළිතුර තෝරන්න.

A. හොඳ වෙළෙඳපොළක් තිබීම

B. ව්‍යාපාර සංවිධාන ක්‍රමය

C. ප්‍රමාණවත් ඉපයීමක් තිබීම

D. නෛතික සීමාවන්

E. මූල්‍ය සම්පාදන මාර්ග

(1) A, B, C (2) A, B, D (3) A, C, D (4) B, C, D

19. සාර්ථක ව්‍යවසායකයෙකු වීමට ව්‍යාපාර පරිසරය හොඳින් අධ්‍යයනය කළ යුතු වේ. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදා දැක්විය හැකි ය. බාහිර පරිසරයේ කොටස් කිහිපයක් A වගුවේ හා ඒ ඒ පරිසර කොටසෙහි අන්තර්ගත සාධක B වගුවේ දැක්වේ.

| A (බලවේග) | B (සාධක) |
|---|---|
| 1. ආර්ථික හා ප්‍රජා | a. නව ශිල්ප ක්‍රම හඳුන්වා දීම |
| 2. දේශපාලන හා නෛතික | b. නීතිරීති පැනවීම |
| 3. ස්වාභාවික හා භූගෝලීය | c. ඇදහිලි හා විශ්වාස |
| 4. විද්‍යාත්මක හා තාක්ෂණික | d. දේශගුණික තත්ත්ව |
| 5. සමාජ හා සංස්කෘතික | e. ජනවාර්ගික සංයුතිය |

A වගුවේ පරිසරයන්ට අදාළ B වගුවේ සාධක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) 1 b, 2 d, 3 c, 4 a, 5 e (2) 1 b, 2 e, 3 d, 4 a, 5 c

(3) 1 e, 2 b, 3 d, 4 a, 5 c (4) 1 e, 2 b, 3 d, 4 c, 5 a

20. භාණ්ඩයක් හෝ සේවාවක් මිලදී ගැනීමට පාරිභෝගිකයින් පොලඹවා ගැනීම සඳහා ව්‍යාපාරිකයෙකුට යොදාගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ

(1) බෙදාහැරීම ය. (2) මිල කිරීම ය.

(3) ප්‍රවර්ධනය කිරීම ය. (4) සන්නමක් යෙදීම ය.

21. පාරිභෝගිකයකු භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී විවිධ සාධක සැලකිල්ලට ගනී. ඒවා අතුරෙන් ප්‍රධාන සාධක **පමණක්** ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) මිල, පාරිභෝගික රුචිය, මිලදී ගැනීමේ හැකියාව

(2) පාරිභෝගික ආදායම, සමාජ තත්ත්වය, පාරිභෝගික රුචිය

(3) මිල, ආදේශක භාණ්ඩ මිල, පාරිභෝගික ආදායම

(4) පාරිභෝගික රුචිය, සමාජ තත්ත්වය, භාණ්ඩයේ සන්නම

22. ව්‍යවසායකයින් වෙළෙඳපොළට භාණ්ඩ ඉදිරිපත් කිරීමේදී වෙළෙඳපොළ විවිධ කොටස්වලට වෙන් කර ගන්නා බව දැකිය හැකි ය. පහත A වගුවෙන් දැක්වෙන්නේ ව්‍යවසායකයින් වෙළෙඳපොළ කොටස්කර ගැනීමට යොදා ගන්නා පදනම් ය. B වගුවෙන් දැක්වෙන්නේ එම පදනම්වල අන්තර්ගත වන සාධක ය.

| A (පදනම්) | B (සාධක) |
|---|---|
| 1. ජන විකාශ | a. දේශගුණය |
| 2. භූගෝලීය | b. ස්ත්‍රී පුරුෂ භාවය |
| 3. චර්යාත්මක | c. ජීවන රටාව |

A වගුවේ දැක්වෙන පදනම් හා B වගුවේ දැක්වෙන සාධක සමඟ නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) 1 a, 2 b, 3 c (2) 1 b, 2 c, 3 a (3) 1 c, 2 a, 3 b (4) 1 b, 2 a, 3 c

23. වෙළෙඳපොළට ඉදිරිපත් කරන බොහෝ භාණ්ඩ කිසියම් සන්නම් නාමයකින් යුක්තව ඉදිරිපත් කරන බව දැකිය හැකිය. කිසියම් නිෂ්පාදනයකට සන්නමක් යොදා ගැනීමේ මූලික අරමුණ වන්නේ

(1) පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම ය.

(2) භාණ්ඩයේ ගුණාත්මකභාවය පෙන්නුම් කිරීම ය.

(3) තරඟකාරී භාණ්ඩවලින් වෙන්කර හඳුනා ගැනීම ය.

(4) භාණ්ඩයේ විශේෂ ගතිලක්ෂණ පෙන්නුම් කිරීම ය.

24. නිෂ්පාදිතය සඳහා දරූ පිරිවැයට යම් ලාභ ප්‍රතිශතයක් එකතු කිරීමෙන් තීරණය කරනු ලබන මිල හඳුන්වන්නේ

(1) ඉලක්ක ඉපැයුම් මිල ලෙස ය. (2) ලකුණු කළ මිල ලෙස ය.

(3) පවත්නා මිල ලෙස ය. (4) සමච්ඡේද මිල ලෙස ය.

[ හතරවැනි පිටුව බලන්න.

25. මෙරට වෙළෙඳපොළෙන් කිරිපිටි පැකැට්ටුවක් පාරිභෝගිකයා මිලදී ගන්නා අවස්ථාව දක්වා බෙද හැරීමේ මාර්ගය දක්වෙන පිළිතුර තෝරන්න.
   (1) නිෂ්පාදකයා → පාරිභෝගිකයා
   (2) නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්ද → පාරිභෝගිකයා
   (3) නිෂ්පාදකයා → නියෝජිතයා → පාරිභෝගිකයා
   (4) නිෂ්පාදකයා → තොග වෙළෙන්ද → සිල්ලර වෙළෙන්ද → පාරිභෝගිකයා

26. ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් දහදෙනෙකුගේ සහභාගීත්වය අවශ්‍ය වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ
   (1) සීමාසහිත පොදු සමාගම ය. (2) සීමාසහිත පෞද්ගලික සමාගම ය.
   (3) සමුපකාර සමිතිය ය. (4) හවුල් ව්‍යාපාරය ය.

● ප්‍රශ්න අංක **27** සිට **30** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු උපයෝගී කරගන්න.

2010.12.01 දින රවිඳු තමා සතුව තිබූ රු. 300 000 ක මුදල හා රු. 200 000 ක බැංකු ණයක් ලබාගෙන ළමා ඇඳුම් මිලදීගෙන විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. ව්‍යාපාර කටයුතු සඳහා රු. 100 000 ක කඩ කාමරයක් හා රු. 50 000 ක ලී බඩු මිලදී ගන්නා ලදී. එදින ම ඔහු විසින් රු. 25 000 ක ළමා ඇඳුම් තොගයක් අත්පිට මුදලට ගත් අතර රු. 15 000 ක ළමා ඇඳුම් තොගයක් 'ළමා සළු' වෙළෙඳසැලෙන් ණයට ගන්නා ලදී.

27. රවිඳුගේ ව්‍යාපාරයේ හිමිකම (ප්‍රාග්ධනය) වන්නේ
   (1) රු. 200 000 කි. (2) රු. 300 000 කි. (3) රු. 500 000 කි. (4) රු. 650 000 කි.

28. රු. 200 000 ක බැංකු ණයක් ලබාගැනීම මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වෙන පිළිතුර තෝරන්න.

| | වත්කම් | = හිමිකම | + වගකීම් |
|---|---|---|---|
| (1) | +200 000 | — | +200 000 |
| (2) | +200 000<br>−200 000 | — | — |
| (3) | +200 000 | +200 000 | — |
| (4) | — | −200 000 | +200 000 |

29. 2010.12.01 දිනට මෙම ව්‍යාපාරයේ මුළු වත්කම්
   (1) රු. 150 000 කි. (2) රු. 190 000 කි. (3) රු. 500 000 කි. (4) රු. 515 000 කි.

30. රු. 15 000 ක ළමා ඇඳුම් තොගයක් 'ළමා සළු' වෙතින් ණයට ලබාගැනීම සටහන් කෙරෙන මූලික පොත හා ඒ සඳහා භාවිත කෙරෙන මූලාශ්‍ර ලේඛනය වන්නේ පිළිවෙළින්
   (1) ගැනුම් පොත හා වවුචරයයි. (2) මුදල් පොත හා වවුචරයයි.
   (3) ගැනුම් පොත හා ඉන්වොයිසියයි. (4) මුදල් පොත හා ඉන්වොයිසියයි.

● අංක **31** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු උපයෝගී කර ගන්න.

කුඩා කළ සිට ම විවිධ නව නිර්මාණ කිරීමට උනන්දුවක් දක්වූ නයනි පාසල් අධ්‍යාපනයෙන් පසු ස්වයං රැකියාවක් කිරීමට අදහස් කරයි. ඇය පෙරපාසල් දරුවන් සඳහා රෙදිවලින් කලාත්මක බෑගයක් නිෂ්පාදනය කිරීමටත් එය පළමුව තම ප්‍රදේශයේ පෙරපාසල්වලට ද පසුව දිවයිනේ වෙනත් ප්‍රදේශවල පෙරපාසල්වලට ද සැපයීමට බලාපොරොත්තු වෙයි. ඇය මේ සඳහා ඇයගේ ස්ථාවර තැන්පතු ගිණුමේ ඇති රු. 100 000 ක මුදල යෙදවීමටත් 12% වාර්ෂික පොලියකට රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීමටත් රු. 24 000 ක් වූ මහන මැෂිමක් මිලදී ගැනීමටත් මාසික කුලිය රු. 1 500 බැගින් ගෙවීමට නගරයෙන් කඩ කාමරයක් කුලියට ගැනීමටත් අපේක්ෂා කරයි. කඩ කාමරය ව්‍යාපාරයට සුදුසු පරිදි සකස් කිරීමට රු. 5 000 ක මුදලක් වැයවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

ඇය පළමු මාසය තුළ බෑග් 500 ක් නිපදවීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා පහත සඳහන් වියදම් ඇස්තමේන්තුවක් කර ඇත.

| | | | |
|---|---|---|---|
| රෙදි සඳහා | රු. 15 000 | මැෂින් ක්‍රියාකරවන්නිය සඳහා මාසික වැටුප | රු. 7 500 |
| සිපර් සඳහා | රු. 5 000 | විදුලි ගාස්තු | රු. 1 700 |
| විවිධ වර්ණ නූල් සඳහා | රු. 6 500 | දුරකථන ගාස්තු | රු. 800 |

මහන මැෂිම වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීමටත් මාසය තුළ නිපදවනු ලබන බෑග් 500 ම එකක් රු. 100 බැගින් එම මාසය තුළදී ම අලෙවි කිරීමටත් නයනි බලාපොරොත්තු වෙයි.

31. නයනි විසින් පිළියෙල කරනු ලබන ව්‍යාපාර සැලැස්මේ තම නිෂ්පාදිතය වූ පෙර පාසල් බෑගයෙහි නිෂ්පාදන පිරිවැය දක්විය යුත්තේ
(1) විධායක සාරාංශයේ ය. (2) මෙහෙයුම් සැලසුමේ ය.
(3) අලෙවි සැලසුමේ ය. (4) මූල්‍ය සැලසුමේ ය.

32. බෑග් 500 ක් නිෂ්පාදනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු සෘජු පිරිවැය
(1) රු. 15 000 කි. (2) රු. 21 000 කි. (3) රු. 29 000 කි. (4) රු. 34 000 කි.

33. බෑග් 500 ක් නිෂ්පාදනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු වක්‍ර පිරිවැය
(1) රු. 1 500 කි. (2) රු. 3 000 කි. (3) රු. 5 000 කි. (4) රු. 6 000 කි.

34. එක් බෑගයක් නිෂ්පාදනය කිරීම සඳහා පිරිවැය (ඒකක පිරිවැය)
(1) රු. 90 කි. (2) රු. 80 කි. (3) රු. 77 කි. (4) රු. 68 කි.

35. මෙම ව්‍යාපාරයේ ආරම්භක ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය වන්නේ
(1) රු. 124 000 කි. (2) රු. 100 000 කි. (3) රු. 25 500 කි. (4) රු. 24 000 කි.

36. පළමු මාසය අවසාන දිනට පිළියෙල කෙරෙන ඇස්තමේන්තුගත ශේෂ පත්‍රයෙහි බැංකු ණය රු. 50 000 දක්විය යුත්තේ
(1) ප්‍රාග්ධනය ලෙස ය. (2) ජංගම වගකීමක් ලෙස ය.
(3) ජංගම නොවන වගකීමක් ලෙස ය. (4) ජංගම නොවන වත්කමක් ලෙස ය.

37. බෑග් 500 ම පළමු මාසය තුළ අලෙවි කිරීමට හැකි වේ නම්, පළමු මාසයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්විය යුතු මුළු මුදල් ගලා ඒම්
(1) රු. 200 000 කි. (2) රු. 150 000 කි. (3) රු. 100 000 කි. (4) රු. 50 000 කි.

38. පළමු මාසය සඳහා ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී බැංකු ණය පොලී ලෙස සඳහන් කළ යුත්තේ
(1) රු. 6 000 කි. (2) රු. 1 200 කි. (3) රු. 600 කි. (4) රු. 500 කි.

39. මෙම ව්‍යාපාරයේ මෙහෙයුම් පෙර වියදම (ආයෝජනය)
(1) රු. 150 000 කි. (2) රු. 100 000 කි. (3) රු. 6 500 කි. (4) රු. 5 000 කි.

40. නයනිට බැංකු ණය ලබාගත හැකි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන්නේ
(1) ලංකා බැංකුව ය. (2) මහජන බැංකුව ය.
(3) සණස සංවර්ධන බැංකුව ය. (4) ජාතික සංවර්ධන බැංකුව ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

ව්‍යාවසායකත්ව අධ්‍යයනය I, II
முற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

※ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. අගනුවර උසස් පාසලක අධ්‍යාපනය ලැබූ සමීර පාසල් යන අවධියේ සිට ම සිය පියාගේ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳ ව්‍යාපාරයට සහාය දුන්නේ ය. ඔහුගේ අභිලාෂය වන්නේ පියාගේ වෙළඳ ව්‍යාපාරය පාරිභෝගිකයාගේ අවශ්‍යතා හා වුවමනාවලට ගැළපෙන ආකාරයට නවීකරණය කිරීම ය. සමීරගේ පියා මෙම වෙළඳ ව්‍යාපාරය වසර ගණනාවක් තිස්සේ පවත්වාගෙන ගිය ද කාලානුරූපව එය වෙනස් කිරීමට ඔහු මැලිකමක් දක්වූවේ ය. කෙසේ වුව ද මොහු මෙම ව්‍යාපාරය තුළින් විශාල ධනයක් රැස් කරගෙන සිටී. වෙළඳසැළට පැමිණෙන ගනුදෙනුකරුවන් සමඟ සුහදව කතාබහ කිරීමෙන් ඔවුන්ගේ රුචිඅරුචිකම් තේරුම් ගැනීමට සමීර උනන්දුවක් දක්වී ය. මොහු උපතින් ම සමාජශීලී පුද්ගලයකු වීමත් ගනුදෙනුකරුවන්ට සමීප වීමත් නිසා ඔවුන් අතර සමීර ජනප්‍රිය පුද්ගලයෙකු විය. ගනුදෙනුකරුවන් මිලදී ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය ඔවුන්ගේ පරිශ්‍රයට ප්‍රවාහනය කරදීමෙන් ද ගුණාත්මක ගොඩනැගිලි ද්‍රව්‍ය සාධාරණ මිලට සැපයීමෙන් ද මේම ව්‍යාපාරය පුළුල් කිරීමේ හැකියාවක් පවතින බව සමීරට ප්‍රත්‍යක්ෂ විය. එමෙන් ම ගනුදෙනුකරුවන්ට දුරකථන මගින් ඇනවුම් භාරදීමටත් චෙක්පත්, ණයපත් හා බැරපත් වැනි ක්‍රම මගින් ගෙවීම් කිරීමටත් පහසුකම් සැලසීමට සමීර බලාපොරොත්තු වෙයි.

මේ අනුව තනි ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන තම පියාගේ ව්‍යාපාරයට තමා ද ඇතුළු වී නීතිමය ආරක්ෂාවක් ලැබෙන වඩා හොඳ පිළිගැනීමක් ඇති ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට සුදුසු ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරාගෙන එය ලියාපදිංචි කිරීමට සමීර අපේක්ෂා කරයි. දැනට පවතින පියාගේ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පහත දැක්වෙන සේ ගණනය කර ඇත.

| | | | |
|---|---|---|---|
| මුළු ස්ථාවර වත්කම් | - රු. මිලියන 10 | මුළු වගකීම් | - රු. මිලියන 5 |
| මුළු ජංගම වත්කම් | - රු. මිලියන 25 | | |

නවීකරණය කරන ව්‍යාපාරය සඳහා සමීරගේ පියා අමතර රු. මිලියන 20 ක් යෙදවීමට එකඟ විය. තව ද නව ව්‍යාපාරය සඳහා පහත සඳහන් ද මිලදී ගැනීමට අපේක්ෂා කෙරේ.

| | | | |
|---|---|---|---|
| ලොරි 02 | - රු. මිලියන 6 | අත් ට්‍රැක්ටර 02 | - රු. මිලියන 1 |
| විවිධ උපකරණ | - රු. මිලියන 2 | ගොඩනැගිලි සංකීර්ණය | - රු. මිලියන 5 |
| වෙළඳ තොග | - රු. මිලියන 4 | | |

(i) ව්‍යවසායකයින් උපතින් හෝ බාහිර උත්තේජන මගින් බිහිවිය හැකි යැයි මතයක් පවතී. ඉහත සිද්ධියේ සඳහන් සමීර මෙයින් කවර ගණයට අයත් ව්‍යවසායකයකු වන්නේ ද? හේතු දක්වන්න.

(ii) සමීර තුළ දැකිය හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ මෙම සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(iii) සමීර තුළ ව්‍යාපාර දක්ෂකමක් තිබේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) සමීරගේ නව ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට හේතු විය හැකි යැයි ඔබ සිතන සාධක මෙම සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(v) සමීර තම පියා සමඟ අවතීර්ණ වීමට අපේක්ෂා කරන ව්‍යාපාරය සඳහා වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක් දැයි හේතු සහිතව දක්වන්න.

(vi) සමීරගේ පියාගේ ව්‍යාපාරයේ පැවැති ප්‍රාග්ධනය කොපමණ ද?

[ හත්වැනි පිටුව බලන්න.

(vii) නව ව්‍යාපාරයේ ආරම්භක මුළු ස්ථාවර වත්කම් සහ මුළු ජංගම වත්කම් වෙන වෙන ම දක්වන්න.

(viii) නව ව්‍යාපාරයේ ප්‍රාග්ධනය හා මුළු වගකීම් වෙන වෙන ම දක්වන්න.

(ix) නව ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මෙහෙයුම් පිරිවැය කොපමණ ද?

(x) මෙම සිද්ධියේ සඳහන් නොවූව ද සමීරගේ නව ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍යයෙන් ම ඔහු විසින් පිළියෙල කළ යුත්තේ කුමක් ද? *(ලකුණු 02 × 10 = 20 යි)*

2. (i) 'නිර්මාණශීලීත්වය' හා 'නවෝත්පාදනය' අතර පවතින සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) බැංකු හා වෙනත් මූල්‍ය ආයතන කාන්තා ව්‍යවසායකයින්ට ණය මුදල් සැපයීමට වැඩි කැමැත්තක් දක්වන බව වාර්තා වී තිබේ. මෙයට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර ව්‍යවසායකයින් හා සමාජයීය ව්‍යවසායකයින් වශයෙන් ව්‍යවසායකයින් වර්ග දෙකක් වේ. මෙම **සමාජයීය ව්‍යවසායකයින්** යනු කවරෙක් දැයි හඳුන්වන්න.

(iv) 'ව්‍යවසායකත්ව සංවර්ධනය' තුළින් රටකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(v) ව්‍යවසායකයෙකු වශයෙන් කටයුතු කිරීමේදී පුද්ගලයින්ට විවිධ අභියෝගවලට මුහුණදීමට සිදු වේ. එවැනි අභියෝග **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 × 05 = 10 යි)*

3. (i) කුඩා ව්‍යාපාර බොහොමයක් ආරම්භ කර වසර පහක් තුළ වැයී යන බව වාර්තා වේ. කුඩා ව්‍යාපාර මෙසේ අසාර්ථක වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න.

(ii) ව්‍යවසායකයින් බිහිවීමට පසුබිම් වන සාධක බොහෝ ය. එවැනි සාධක **දෙකක්** නම් කරන්න.

(iii) 'ව්‍යාපාර අවදානම' යනු කුමක් ද? එය අවම කරගත හැක්කේ කෙසේ ද?

(iv) ව්‍යවසායකත්ව භූමිකාවේ සාර්ථකත්වය සඳහා අන්තර් පුද්ගල කුසලතා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම අන්තර් පුද්ගල කුසලතා මොනවා ද?

(v) ව්‍යාපාරික ලෝකය අභියෝගවලින් මෙන් ම ගැටලුවලින් ගහන වූවකි. ව්‍යවසායකයකු ගැටලු විසඳීමේදී ක්‍රියාකළ යුතු ආකාරය අනුපිළිවෙළින් දක්වන්න. *(ලකුණු 02 × 05 = 10 යි)*

4. පුද්ගලයින්ගේ අවශ්‍යතා හා වුවමනා මෙන් ම සමාජයීය හා පරිසර ප්‍රවණතා හා ගැටලු නිසි පරිදි හඳුනාගැනීම ව්‍යාපාර අදහස් ජනිත කරගැනීමට රුකුලක් වේ.

(i) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස පැහැදිලි කරන්න.

(ii) ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය කොටස් කර දක්වන්න.

(iii) ව්‍යාපාර බාහිර පරිසරයේ කොටසක් වන ආර්ථික පරිසරයට ඇතුළත් සාධක **හතරක්** නම් කරන්න.

(iv) ව්‍යාපාර අදහසෙහි යෝග්‍යතාව ඇගයීම සඳහා භාවිත කළ හැකි සාධක **දෙකක්** නම් කරන්න.

(v) ව්‍යාපාර අදහසක් හා ව්‍යාපාර අවස්ථාවක් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 × 05 = 10 යි)*

5. හොඳ ව්‍යාපාර අදහසක් ව්‍යාපාර අවස්ථාවක් බවට පත්කර ගැනීමේ දී ව්‍යාපාර සංවිධාන ක්‍රමය ද වැදගත් වේ.

(i) ව්‍යාපාර අදහසට යෝග්‍ය වන ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බැලෙන නිර්ණායක **හතරක්** සඳහන් කරන්න.

(ii) හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.

(iii) කේවල ස්වාමි ව්‍යාපාර සංවිධාන ක්‍රමයට සාපේක්ෂව හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයෙහි දකිය හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න.

(iv) වෙනත් ව්‍යාපාර සංවිධානවල දකිය නොහැකි, සමූපකාර ව්‍යාපාර සංවිධාන ක්‍රමයට පමණක් ආවේණික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(v) පහත සඳහන් ව්‍යාපාර සංවිධානවල **ප්‍රාග්ධනය** සැපයීම හා **කළමනාකරණය** කෙරෙන ආකාරය වෙන වෙන ම දක්වන්න.

(අ) කේවල ස්වාමි ව්‍යාපාර
(ආ) හවුල් ව්‍යාපාර
(ඉ) සීමාසහිත පොදු සමාගම්
(ඊ) සමූපකාර සමිති *(ලකුණු 02 × 05 = 10 යි)*

6. 2010 නොවැම්බර් 01 දින ආරම්භ කළ චරිත්ගේ ව්‍යාපාරයේ ගනුදෙනු කිහිපයක් පහත දක්වේ.

| | |
|---|---|
| චරිත් ප්‍රාග්ධනය යෙදවීම | රු. 150 000 |
| ලි බඩු මිලදී ගැනීම | රු. 25 000 |
| අත්පිට ගැනුම් | රු. 65 000 |
| ණයට ගැනුම් | රු. 55 000 |
| ගෙනඒමේ කුලී ගෙවීම | රු. 3 500 |
| අත්පිට විකුණුම් | රු. 76 000 |
| ණයට විකුණුම් | රු. 60 000 |
| කඩකුලී ගෙවීම | රු. 2 000 |
| ණයගැතියන්ගෙන් ලැබීම | රු. 49 000 |
| ණයහිමියන්ට ගෙවීම | රු. 47 500 |
| සේවකයාට වැටුප් ගෙවීම | රු. 5 000 |
| චරිත් තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් මුදල් ගැනීම | රු. 7 000 |

(i) චරිත්ගේ ව්‍යාපාරයේ ඉහත සඳහන් ගනුදෙනුවලින් මුදල් පොතේ සටහන් **නොවන** ගනුදෙනු දෙකක් ඇත. එම ගනුදෙනු **දෙක** සඳහන් කර, ඒවා සටහන් කළ යුතු මූලික පොත් හා ඒ සඳහා භාවිත කෙරෙන මූලාශ්‍ර ලේඛන වෙන වෙන ම සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) ඉහත සෙසු ගනුදෙනු මුදල් පොතේ සටහන් කිරීමේදී භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛන වර්ග **දෙක** නම් කරන්න. *(ලකුණු 01 යි)*

(iii) ඉහත තොරතුරු භාවිතයෙන් චරිත්ගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර, එහි ශේෂය දක්වන්න. *(ලකුණු 06 යි)*

*(මුළු ලකුණු 10 යි)*

7. රොෂාන් 2011.01.01 දින සිමෙන්ති ග්‍රිල් කැට නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ඔහුට හිමි රු. 120 000 ක් වටිනා ගොඩනැගිල්ල භාවිත කිරීමට ද 12% වාර්ෂික පොලියකට රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීමට ද රු. 24 000 කට යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට ද බලාපොරොත්තු වේ. පළමු මාසය තුළ ග්‍රිල් කැට 1 000 ක් නිපදවීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා පහත සඳහන් වියදම් ඇස්තමේන්තුවක් කර ඇත.

| | |
|---|---|
| සිමෙන්ති සඳහා | රු. 30 000 |
| වැලි සඳහා | රු. 15 000 |
| තීන්ත සඳහා | රු. 2 000 |
| අමුද්‍රව්‍ය ප්‍රවාහන වියදම් | රු. 4 500 |
| විදුලි ගාස්තු | රු. 2 500 |

එක් අයෙකුට මාසික වැටුප රු. 5 000 බැගින් සේවකයින් දෙදෙනෙකු ග්‍රිල් කැට නිපදවීම සඳහා යොදවා ගැනීමටත් මාසයකට කාර්යාල වියදම් රු. 3 000 ක් දැරීමටත් වාර්ෂිකව යන්ත්‍ර හා උපකරණ පිරිවැය මත 10% බැගින් ක්ෂය කිරීමටත් අපේක්ෂා කෙරේ. ග්‍රිල් කැටයක් රු. 100 බැගින් මුළු නිෂ්පාදිතය ම මාසය තුළදී ම අලෙවි කිරීමට ද බලාපොරොත්තු වේ.

(i) සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, වෙනත් සෘජු වියදම්, වක්‍ර වියදම් හා මුළු නිෂ්පාදන පිරිවැය වෙන වෙන ම දක්වෙන සේ 2011.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ලේඛනය පිළියෙල කරන්න. *(ලකුණු 05 යි)*

(ii) 2011.01.31 දිනෙන් අවසන් මාසය සඳහා රොෂාන්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත ආදායම් (ලාභාලාභ) ප්‍රකාශය පිළියෙල කරන්න. *(ලකුණු 05 යි)*

*(මුළු ලකුණු 10 යි)*

***